# පහේ ශිෂ්‍යත්වය ජය ගන්න

# මම සූදානම් වුණු හැටි



මෙතුෂි උමාෂා රාජපක්ෂ

# පහේ ශිෂ්‍යත්වය ජය ගන්න
# මම සූදානම් වුණු හැටි

ප්‍රථම එළි දැක්වීම - 15/11/2023

ISBN- 978-624-206-771-1

මෙතුෂි උමාෂා රාජපක්ෂ

# පිදුම

'අ'  යන්නේ සිට මා හට සිප් සතර

කියා දීමට වෙර දරණ

මාගේ දෙමව්පියන්ටත් පාසල් සෙවනේ

මා හට අකුරු කරන

මාගේ ආදරණීය ගුරු මෑණිවරුන්ටත්,

පියවරුන්ටත් මෙම

පොත ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



දැනට සිව් වසරකට කලින් මම මුල්වරට මගේ මවගේ

සෙනෙහසින් මිදී පාසල වෙත පැමිණියා.

මට ඒ දවස අද මෙන් මතකයි. පාසලේ දී මුලින්ම මාව

වැළඳ ගත්තේ මගේ ආදරණීය පන්ති භාර ගුරුතුමිය. ඇය

හරිම ලස්සනයි මෙන්ම  කරුණාවන්තයි.



මම පන්තියට යනවිට මට යාලුවෝ බොහොමයක් හම්බවුණා. ඒ නිසා මට මගේ පාසල සතුටු උයනක් මෙන් දැනුණා. එදා පටන් පාසල් ඒමට මා වඩාත් කැමැත්තක් දැක්වුවා.

මම උදෑසනම ප්‍රබෝධයෙන් අවදි වී පාසල වෙත පැමිණ ඉතා සතුටින් කාලය ගත කළා. පාසල් භූමිය මට පෙනුනේ කිරි කොක් රැනක් එහා මෙහා යන අයුරින් ඉතා ලස්සනටයි.



ඒ අයුරින් මම දිනපතා පාසල් ගියා. පාසලේ වැඩ කටයුතු මෙන්ම විෂය බාහිර කටයුතු හොඳින් කරගෙන ගියා. ක්‍රීඩා තරග, චිත්‍ර තරඟ මෙන්ම වෙනත් තරග සඳහාත් මම සහභාගී වුණා. මගේ මේ සෑම කටයුත්තකටම මගේ සෙවනැල්ල මෙන් සිටියේ මවත්, පියාත් දෙදෙනායි. මම ටිකෙන් ටික ලොකු වසර වලට පා තබමින් 2, 3, 4 ශ්‍රේණි වලට ගියා.


මම මගේ අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන යාම නිසා සෑම වාර විභාගයකින්ම ඉහළින්ම ලකුණු ලබා ගැනීමට මට හැකි වුණා. මේ සෑම විටම මට වඩාත් ශක්තියක් වූයේ මගේ මවයි. ඇය මගේ පාසල් කටයුතු අවසන් වූ පසු සෑම දිනකම සවස ගණිත ගැටලු ,සාමාන්‍ය දැනීම හා අනෙකුත් විෂය කරුණු ද මට කියා දෙමින් පසුගිය ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයීමට කියාදුන්නා.



මම ඒ සියල්ල ඉගෙනීමෙන් ලැබුණු අත්දැකීම් සමග පහ ශ්‍රේණියට ඇතුළත් වුණා. මම එදා සිට තව තවත් උනන්දු වී වැඩකටයුතු කරගෙන ගියා. ප්‍රශ්න පත්‍ර, විවිධ ගැටලු විසඳීමෙන් කෙටි ක්‍රම සොයා ගත්තා. පොත් පත් කියවා මම තව තව දැනුම රැස්කර ගත්තා.



නොතේරුණු ගණිත ගැටළු මම ගුරුවරුන්ගෙන් විමසුවා. ශිෂ්‍යත්වයට මාසයක් වැනි කෙටි කාලයක් තිබුණා. මම පාඩම් කළ දේවල් නැවත නැවත මතක් කර ගත්තා .දිනෙන් දින ශිෂ්‍යත්ව කඩඉම ළං වුණා. එම දිනය උදා වුණා එදා ඔක්තෝබර් 15 ඉරිදා දිනයක්. මම උදෑසනින්ම නැගිට විභාග ශාලාව වෙත යාමට සූදානම් වූයේ බුදුන් වැඳ දෙමාපිය ආශිර්වාදය ද ඇතිවය.



මා කිසිදු බියකින් තොරව විභාගයට මුහුණ දීමට සූදානම් බව දැනුණා. මට ප්‍රශ්නපත්‍රය ලැබුණු විට හොදින් කියවා පිළිතුරු ලිව්වා. මගේ සිතට සැහැල්ලුවක් මෙන්ම සතුටක් ඇති වුණා.



දින, සති, කෙමෙන් කෙමෙන් ගෙවී ගියා. ප්‍රතිඵල එන දින ප්‍රවෘත්ති මගින් දැනගන්න ලැබුණා. හොඳ ප්‍රතිඵලයක් එනතුරු මම මග බලා සිටියා.

මා බලාපොරොත්තුවෙන් සිටියේ කඩඉම පසුකරමින් ජය ලැබීමටයි.

මම එතෙක් ඇඟිලි ගනිමින් සිටියා. ඒ දවස උදාවුණා. ප්‍රතිඵල නිකුත් වුණා. මගේ ප්‍රතිඵල බැලූ අම්මා ඉතා සතුටින් පැවසුවේ මා ඉහළින්ම සමත් වී ඇති බවයි. මටත් පවුලේ අපි සැමටත් ඉතා ලොකු සතුටක් දැනුණා.



**“උත්සාහවන්තයා ජයගන්නා බව”** මවත් , පියාත් මට පැහැදිලි කර දුන්නා .සියලු දෙනා මට ආශිර්වාද කළා. සුභපැතුවා. ලොකු සතුටක් දැනුණා



**ආදර්ශය : "උත්සාහවන්තයා ජය ගනී "**

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට
යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක